www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පලාත් සභා මැතිවරනය පුලුල්ව පැතිරුනු මහජන විරසක භාවය සහ අතෘප්තිය එලිදරව් කරයි

## Sri Lankan provincial elections reveal widespread alienation and discontent

**සමන් ගුනදාස විසිනි**

**2008 සැප්තැම්බර් 15**

සිය එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) පසුගිය මාසයේ පැවති මැතිවරනවලින් බහුතරයක් දිනා ගැනීමෙන් පසුව සැප්තැම්බර් 4 දා ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ උතුරු මැද සහ සබරගමුව පලාත් සභාවල මහ ඇමතිවරු පත් කලේ ය.

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව දැන් පවත්වා ගෙන යුද්ධය ද ඇතුලු සිය ආන්ඩුවේ ප්‍රතිපත්තිවලට සහයෝගය ලැබී ඇති බව කියාපෑම පිනිස රාජපක්ෂ මෙම ජයග්‍රහනය ගසාකා තිබේ. මැතිවරනයෙන් අනතුරුව ඔහු ප්‍රකාශ කර සිටියේ "උතුරු මැද සහ සබරගමුවේ නියෝජනය වූ මහජන මතය මුලු රටේම මතය" බව යි. තථ්‍ය වසයෙන් ගත් කල, මැතිවරන ප්‍රතිඵල වනාහි ඡන්ද ගරා ගැනීම ඉලක්ක කර ගෙන ම ලැජ්ජා විරහිත ලෙස දැවැන්ත පරිමානයෙන් රජයේ මුදල් වියදම් කොට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ, විවෘත මැර බලයේ සහ ආන්ඩුවට හා එහි පිලිවෙත්වලට එරෙහිව සෙසු සංස්ථාපිත පක්ෂ අතරින් කිසිදු විකල්පයක් ඉදිරිපත් නොවීමේ ප්‍රතිඵලයකි.

රාජපක්ෂගේ පුරසාරම් කෙසේ වෙතත්, එජනිසයේ ඡන්ද ප්‍රමානය සහ එය දිනාගත් ආසන සංඛ්‍යාව අගෝස්තු 23 මැතිවරනයේ දී සැබැවින් ම පහල බැස තිබේ. පාලක සභාගය උතුරු මැද පලාත් සභාවේ ආසන 33න් 20ක් දිනා ගත් අතර -- 2004 දී දිනා ගත් සංඛ්‍යාවට වඩා දෙකක් අඩුවෙනි -- සබරගමුව පලාත් සභාවේ ආසන 44න් 25ක් දිනා ගත්තේ ය -- 2004 දී දිනා ගත් සංඛ්‍යාවට වඩා තුනක් අඩුවෙනි. උතුරු මැද එජනිස ඡන්ද සංඛ්‍යාව රාජපක්ෂ 2005 නොවැම්බර් ජනාධිපතිවරනයේ දී එම ප්‍රදේශයෙන් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව වන 341,539 සිට 307,457 දක්වා පහල බැස තිබේ. සබරගමුව සම්බන්ධයෙන් ගත හොත්, එජනිස ඡන්ද සංඛ්‍යාව 533,444 සිට 472,789 දක්වා පල්ලම් බැස ඇත.

වඩාත් ම වැදගත් සංඛ්‍යාව වූයේ එජනිස දිනා ගෙන ඇත්තේ පලාත් දෙකේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 36ක් පමනක් ය යන්න යි. ඉතිරි සියයට 64 එක්කෝ විපාර්ශ්වික පක්ෂවලට ඡන්දය දුන් අතර නැතහොත් කොහෙත්ම සිය ඡන්දය පාවිච්චි කලේ නැත. යුද්ධය සඳහා දුන් ඡන්දයක් නොව, ඒ වෙනුවට, මැතිවරන ප්‍රතිඵලය වනාහි මහජන විරසක භාවය, වෛරය හා 25 වසරක යුද්ධය අඛන්ඩව ඉදිරියට යන හා ජීවන මට්ටම් කඩා වැටෙන තතු තුල සමස්ත දේශපාලන සංස්ථාපිතය ම කෙරෙහි පවත්නා සතුරු භාවය තව දුරටත් පිලිබිඹු දරන දර්ශකයකි.

මැතිවරන ව්‍යාපාරය මුලුල්ලේ ම රාජපක්ෂ සහ එජනිස අවධාරනය කලේ යුද්ධය ප්‍රධාන කාරනාව බව යි. ඕනෑම විරුද්ධත්වයක් දේශද්‍රෝහිත්වයක් ලෙස සැබැවින් ම හංවඩු ගසමින්, ජනාධිපති ප්‍රකාශ කර සිටියේ, මැතිවරන පරාජයකින් අදහස් කෙරෙන්නේ "හමුදාව මෙතෙක් ලබා ගෙන ඇති ජයග්‍රහන අහිමි වීම" බව යි. වාර්ගික ආතති ඇවිලවීම මගින් පාලක සභාගය උත්සාහ කලේ තමන් නිර්මානය කර ඇති සමාජ ව්‍යසනයෙන් මහජන අවධානය වෙනතකට අපසරනය කිරීමට යි.

ආහාර හා තෙල් සඳහා වූ ඉහල ජාත්‍යන්තර මිල ගනන්, දැවැන්ත මිලිටරි වියදම්වල ආර්ථික ආතති සමග එක්ව, සියයට 30 මට්ටමේ දුවන උද්ධමනයක් නිර්මානය කර තිබේ. සිය මිලිටරි වියදම් සඳහා මුදල් සොයා ගනු පිනිස, ආන්ඩුව වැඩ කරන ජනතාව මත දැවැන්ත ප්‍රහාර එල්ල කරමින්, අත්‍යාවශ්‍ය සේවා සහ මිල සහනාධාර කපා දමා ඇත. පලාත් දෙකේ ම විශාල වසයෙන් සිටින ග්‍රාමීය ජනගහනය අතර දරිද්‍රතාව පුලුල්ව පැතිර පවතී.

උතුරේ යුද කලාපයන්ට යාබදව පිහිටි උතුරු මැද පලාත තුල, එජනිස, අතීතයේ දී එල්ටීටීඊයේ ප්‍රහාරයන්ට ලක්ව ඇති දුප්පත් සිංහල ගොවි ජනතාවගේ භීතිය සිය වාසිය පිනිස ඩැහැ ගත්තේ ය. කොලඹට ගිනිකොන දෙසින් පිහිටි සබරගමුවට සිංහල වර්ගවාදීන්ගේ ඉලක්කයක්ව පවතින බොහෝ සෙයින් දෙමල ජනවර්ගයෙන් සමන්විත වන තේ සහ රබර් වතු කම්කරුවන් විශාල සංඛ්‍යාවක් ද ඇතුලත් වේ.

එජනිස, කෙසේ වෙතත්, හුදෙක් සිය යුදකාමී වාචාලත්වය මත පමනක් පදනම් වූයේ නැත. ප්‍රචන්ඩත්වය හා බියගැන්වීම් මැතිවරන ව්‍යාපාරය පුරා ම පැතිර පැවතුනි. මැතිවරන නිරීක්ෂක කන්ඩායමක් වන නිදහස් හා සාධාරන මැතිවරන සඳහා ව්‍යාපාරය (කැෆේ) ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ සිද්ධීන් 200ක් පමන වාර්තා කල අතර, ඒවා බොහෝ සෙයින් එජනිස විසින් අවුලුවන ලද ඒවා ය. මැතිවරනයට පසු දින, මැරයෝ විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයට ගිනි තබා පක්ෂ සංවිධායකවරයාට පහර දුන්නේ පොලීසිය බලා සිටිය දී ය.

පලාත් දෙකේ දී ම, පාලක සභාගය මැතිවරන අල්ලස් දීමේ යෙදී ගත්තේ ය. අනුරාධපුර ඡන්දදායකයෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී යː "ආන්ඩුව ප්‍රචන්ඩ ක්‍රියා සිදු කරනවා විතරක් නෙවි. අවුරුදු ගනනාවක් ම නොතකා ඉදලා, ආන්ඩු පක්ෂය පසුගාමී ගම්බද පලාත්වල සමහර පාරවල් කඩිමුඩියේ හදනවා. නිදහස් සන්ධානයේ අපේක්ෂකයො තමන්ගෙ ගෙවල් හදාගන්න එහෙම නැත්නම් ඒවා අලුත්වැඩියා කර ගන්න දගලන දුප්පත් ගොවියන්ට සෙවිලි තහඩු, සිමෙන්ත මලු වගේ ගොඩනැගිලි ද්‍රව්‍ය බෙදා දුන්නා. සහන මිලට දිගට ම පොහොර දෙන බවට, වීවලට ඉහල මිලක් දෙන බවට ඒගොල්ල පොරොන්දු වුනා. නිදහස් සන්ධානය දිනුවොත් කොරියන් සමාගම්වල රැකියාවලට ඉල්ලුම් කරන්න තමන්ට පුලුවන් වේවි කියන මිථ්‍යාව ඇති කරන්න රැකියා නැති තරුනයන්ට ඉල්ලුම් පත්‍ර පවා බෙදලා දුන්නා."

## විරුද්ධත්වයක් නැතිකම

යුද්ධය දිගට ම ගෙන යාමටත් එහි සමාජ බලපෑමටත් එරෙහිව වැඩ කරන ජනතාව අතර පවත්නා නොසන්සුන්තාවට සහ විරුද්ධත්වයට මැතිවරන තුල ප්‍රකාශනයක් සොයා ගත නොහැකි විය. ප්‍රධාන විරුද්ධ පක්ෂ සියල්ල ම සිංහල වර්ගවාදී දේශපාලනයේ එරී සිටින අතර රාජපක්ෂ එල්ටීටීඊය සමග පවත්නා වසර 25ක යුද්ධය යලි ඇරඹීමට ඔවුහු සහයෝගය දී තිබේ. ජීවන මට්ටම් වැඩි දියුනු කිරීම පිලිබඳ හිස් පොරොන්දු දෙන අතර ම, එජාපය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යුද්ධය සඳහා සිය පූර්න සහයෝගය ලැබෙන බව පැහැදිලි කිරීමෙහි ලා බොහෝ සෙයින් වෙහෙස වූහ.

දක්ෂිනාංශික එජාපය, එල්ටීටීඊය සමග සටන් විරාමයක් මගින් 2002 දී තමන් ආරම්භ කල ඊනියා සාම ක්‍රියාදාමය යලි ඇරඹීම පිලිබඳ ඉල්ලීම මුලුමනින් ම අතහැර දමා ඇත. ඒ වෙනුවට පක්ෂය උද්ඝෝෂනය ගෙන ගියේ 1983 දී යුද්ධය ආරම්භ කොට වසර 13ක් තිස්සේ එය පවත්වා ගෙන යාම පිලිබඳ සිය වාර්තාව මත පදනම් වී ගෙන ය. එජාප නායක රනිල් වික්‍රමසිංහ මෙසේ ප්‍රකාශ කලේ යː "ජේ.ආර්. ජයවර්ධන සහ ආර්. ප්‍රේමදාස යන හිටපු ජනාධිපතිවරුන්ගේ ආන්ඩු කාලය තුලත් යුද්ධය පැවතුනා. අපි යුද්ධයට විරුද්ධ නැහැ. අපි විරුද්ධ ආන්ඩුවේ දූෂනයට යි."

එම කාරනාව අවධාරනය කරනු පිනිස, එජාපය උතුරු මැද පලාතේ සිය මහ ඇමති අපේක්ෂකයා ලෙස විශ්‍රාමලත් මේජර් ජෙනරාල් ජානක පෙරේරා තෝරා ගත්තේ ය. පෙරේරා එල්ටීටීඊයට එරෙහිව ක්ෂමා විරහිත ලෙස යුද්ධය ගෙන යාමේ සිය ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ය. ගොවීන්ගේ ඉරනම සහ ඉවසිය නොහැකි ලෙස භාන්ඩ මිල ගනන් නැගීම ගැන ව්‍යාජ අනුකම්පාවක් ප්‍රකාශ කරන අතර ම, වික්‍රමසිංහ සහ එජාපය, රටේ ආර්ථික හා සමාජ අර්බුදයේ ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇති දැවැන්ත මිලිටරි වියදම්වලට විරුද්ධ වී නැත. ඒ වෙනුවට වික්‍රමසිංහ පාලනය කල නොහැකි උද්ධමනය පිටුපසින් පවත්නා එක ම සාධකය ලෙස "ආන්ඩුවේ දූෂනයට හා දුෂ්පරිපාලනයට" මුග්ධ ලෙස බැන වැදුනේ ය.

සැලකිය යුතු ලෙස, ජවිපෙ ඡන්ද සංඛ්‍යාව ද කඩා වැටුනි. එය පලාත් සභා දෙකෙන් දිනා ගත්තේ ආසන 3ක් පමනි -- එය පක්ෂය එජනිසයේ කොටසක් ලෙස පැවති 2004 දී එය දිනා ගත් ආසන 18 සිට තියුනු කඩා වැටීමකි. උතුරු මැද පලාතේ දී, ජවිපෙ ලබා ගත්තේ ඡන්ද 26,738කි. එය 2001 මහ මැතිවරනයේ දී එම පලාත තුල පක්ෂය ලබා ගත් ඡන්ද ප්‍රමානය වන 58,961න් හරි අඩකටත් වඩා අඩු අගයකි. සබරගමුව පලාත තුල එහි ඡන්ද සංඛ්‍යාව 2001 දී තිබූ 77,088 සිට යන්තම් 10,163 දක්වා කඩා වැටුනි.

ජනතාවාදී වාචාලත්වය සහ විටින් විට සිදු කරන සමාජවාදී වාග් පාඨ හඬතැලීම සිංහල වර්ගෝත්තමවාදය සමග කලවම් කරන ජවිපෙ සම්බන්ධයෙන් පවත්නා පුලුල් අපේක්ෂාභංගත්වයක් මෙම ඡන්ද සංඛ්‍යා මගින් පිලිබිඹු කෙරෙයි. 2004 දී, ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක වන එජාපය සහ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සම්බන්ධයෙන් පැවති පුලුල් විරසකභාවයෙන් වාසි ලබා ගෙන සැලකිය යුතු මැතිවරන ජයග්‍රහන ලබා ගැනීමට මෙම පක්ෂය සමත් විය. එහෙත් ජවිපෙ 2004 අප්‍රේල් මස ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් සභාග ආන්ඩුවට එකතු වීමෙන් පසුව, එහි ග්‍රාමීය පදනම් අතර අපේක්ෂාභංගත්වය ඉක්මනින් ම ඇරඹුනි.

ඔවුන්ගේ සහයෝගී පදනම් අහිමි වීම රාජපක්ෂ ආන්ඩුවට පක්ෂය දුන් සහයෝගය මගින් තවත් සංකීර්න කෙරී ඇත. ජවිපෙ 2005 ජනාධිපතිවරනයේ දී එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනශීලී ආස්ථානයක් ගැනීමේ පදනම මත රාජපක්ෂට සහයෝගය දුන්නේ ය. රාජපක්ෂගේ කැබිනට් මන්ඩලයට එක් නොවුනත්, පක්ෂය පාර්ලිමේන්තුව තුල දී සියලු ප්‍රධාන කාරනා

සම්බන්ධයෙන් ආන්ඩුවට සහයෝගය දී තිබේ. පසුගිය දෙසැම්බරයේ දී, ජවිපෙ, මිලිටරි වියදම් තව දුරටත් ඉහල දැමීම සහ සමාජ වැඩපිලිවෙලවල් කප්පාදු කිරීම ඇතුලත් වූ අයවැය යෝජනා සම්මත වීම සහතික කලේ ය.

අප්‍රේල් මාසයේ දී ජවිපෙ භේද විය. ඒ මූලික වසයෙන් ගත් කල, එහි කඩා වැටෙන සහයෝගී පදනම් වර්ධනය කර ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය මත ය. පක්ෂයේ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශ සහ තවත් මන්ත්‍රීවරු 10ක් පක්ෂයෙන් බිඳී එජනිස සමග වඩා සමීප සබඳතාවක් ඇති කර ගැනීමේ ඉදිරිදර්ශනය මත ජාතික නිදහස් පෙරමුන (ජානිපෙ) තැනී ය. ජානිපෙ පලාත් සභා මැතිවරනයේ දී පාලක සභාගය වෙනුවෙන් සැබෑ ලෙසින් ම උද්ඝෝෂනය කලේ ය.

සිය පදනම් යලි ගොඩනගා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, ජවිපෙ රාජපක්ෂ ආන්ඩුවෙන් දුරස්ථ වී ගැනීමේ උත්සාහයක යෙදී තිබේ. කෙසේ වෙතත්, එජාප මෙන් ම, එය ද යුද්ධයේ වඩා ස්ථිරසාර උද්ඝෝෂකයකු ලෙස තමන්ම ඉදිරිපත් කර ගත්තේ ය. වාර්ගික මනෝගතීන් ඇවිලවීමේ ප්‍රයත්නයක් ලෙස, ජවිපෙ නායකයෝ, එල්ටීටීඊයට එරෙහි මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් අවසන් කිරීමේ ඉන්දියානු බලපෑමට යටත් වී ඇතැයි ද ඉන්දියානු ආයෝජකයන්ට ශ්‍රී ලංකාවට පැමිනීමට ඉඩ දී ඇතැයි ද කියමින් ආන්ඩුව විවේචනය කලේ ය. සිංහල ස්වෝත්තමවාදයේ වාග්මාලාව තුල, ඉන්දියානු විරෝධී ප්‍රහාර ඉලක්ක කෙරෙන්නේ දිවයිනේ දෙමල සුලුතරයට එරෙහි තව දුරටත් වෛරය ඇවිස්සීම දෙසට ය.

සිය ව්‍යසනකාරී මැතිවරන ප්‍රතිඵල හමුවේ, ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෙසේ වැලපුනේ යඃ "මහජනතාවගේ සහයෝගය සහ ආදරය ඡන්ද බවට පරිවර්තනය කර ගැනීමට අපට නොහැකි වීමට හේතුව ආන්ඩුවේ ප්‍රචන්ඩත්වය යි. ආන්ඩුව මර්දනය සහ බලය පාවිච්චි කල පසුබිමක් තුල මේ මට්ටමේ ජයග්‍රහනයක් හරි ලබා ගන්න පුලුවන් වීම තරමක් වැදගත්." මැර බලය සහ ප්‍රචන්ඩත්වය පිලිබඳ තමන්ගේ ම දිගු ඉතිහාසයක් ඇති ජවිපෙ අඩු ඡන්ද සංඛ්‍යාවක් ලැබීමට සැබෑ හේතුව වන්නේ, බොහෝ ඡන්දදායකයන් එය ප්‍රධාන පක්ෂවලට මොන යම් හෝ විකල්පයක් ලෙස තව දුරටත් නොදැකීම යි.

දෙමල කතා කරන වතු කම්කරුවන් අතර පදනම් වන ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට මහජන පෙරමුන (යූපීඑෆ්) ද මැතිවරනයේ දී පහලට වැටුනි. මෙම පක්ෂ දෙක ම පාලක එජනිසයේ කොටස්කරුවන් වන අතර ඒවායේ නායකයෝ රාජපක්ෂ ආන්ඩුවේ ඇමති තනතුරු දරති. එහෙත් රාජපක්ෂගේ පිලිවෙත්වලින් දුරස්ථ වී ගැනීමේ උත්සාහයක් ලෙස, ඔවුහු සබරගමුව මැතිවරනය වෙන ම තරග කලහ.

සීඩබ්ලිව්සීයට සබරගමුව පලාත් සභාවේ පැවති එකම අසුන අහිමි වූ අතර එහි ඡන්ද සංඛ්‍යාව 2004 දී තිබූ 10,720 සිට 10,163 දක්වා වැටුනි. යූපීඑෆ් ඡන්ද සංඛ්‍යාව 2004 දී තිබූ 1,806 සිට 1,418 දක්වා පල්ලම් බැස්සේ ය. සීඩබ්ලිව්සී නායක ආරුමුගම් තොන්ඩමන් මෙසේ පවසමින් වතු කම්කරුවන්ට බැන වැදුනේ යඃ "ඔවුන් හරියට ඡන්දය දීලා නැහැ. ඡන්දය දීමේ විධික්‍රම ද නිවැරදි නැහැ." එහෙත් සීඩබ්ලිව්සී සහ යූපීඑෆ් ලද කුඩා ඡන්ද සංඛ්‍යා මගින් පිලිබිඹු වන්නේ, සිය සාම්ප්‍රදායික සංවිධාන කෙරෙහි වතු කම්කරුවන් අතර පවත්නා ගැඹුරු වෛරය යි. වෘත්තීය සමිති ලෙස ද ක්‍රියාත්මක වන මෙම පක්ෂ දෙක වැඩි වැටුප් වෙනුවෙන් පසුගිය ජූලි මස පැවති මහා වැඩ වර්ජනයට විරුද්ධ වීමෙන් සිදු කල ද්‍රෝහී ක්‍රියාකලාපය බොහෝ දෙනෙකුට බලපා ඇති බවට ද සැකයක් නැත.

මැතිවරනය හමාර වීමත් සමග ම, කොලඹ මාධ්‍ය ද එජනිස ජයග්‍රහනය යුද්ධයට ලැබෙන සහයෝගය පෙන්නුම් කරන බවට ප්‍රකාශ කිරීමට රාජපක්ෂ සමග පෙලගැසුනි. නිදසුනක් ලෙස, *ඩේලි මිරර්* කතුවැකියකින් ප්‍රකාශ කලේ, ආන්ඩුව "රාජ්‍ය බලය අයුතු ලෙස යොදා ගෙන" තිබුනත්, "එහි වත්මන් ජයග්‍රහනයට ප්‍රධාන වසයෙන් සම්මාදම් වී ඇත්තේ එල්ටීටීඊ ත්‍රස්තවාදය තුරන් කිරීමේ එහි ප්‍රයත්යේ දී ආන්ඩුව ලබා ගෙන ඇති සාර්ථකත්වය බවට සැකයක් නැති තරම් ය."

යථාර්ථය නම්, මැතිවරන ප්‍රතිඵලය මගින් යලිත් වරක් පෙන්නුම් කෙරෙන්නේ, යුද්ධය අවසන් කිරීම, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ ශිෂ්ඨ සම්පන්න ජීවන මට්ටම් උදෙසා සාමාන්‍ය වැඩ කරන ජනතාවට පවත්නා අභිලාෂයන් ද ප්‍රධාන දේශපාලන පක්ෂ සියල්ල ද අතර පවතින පුලුල් පරතරය බව යි.

© www.wsws.org